# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## 12 පාඩම

## සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 12 පාඩම

# කර්මය හා එහි ප්‍රභේද හැඳින ගනිමු

# කර්මය හා එහි ප්‍රභේද හැඳින ගනිමු

- කර්මය යනු....

**"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා"**

('මහණෙනි, මම චේතනාව ම කර්මය යැයි කියමි. සිතින් සිතා, කයින් වචනයෙන් සිතින් කර්ම සිදුකරයි')

# බුදු දහම අනුව මිනිසුන්ගේ සචේතනික ක්‍රියාවන් ක්‍රියාත්මක වන (කර්ම රැස්වන) දොරටු තුනකි

1. සිත - චේතනා
2. කය - දෑත්, දෙපා ආදී කායික අඟ පසඟ
3. වචනය - කතාබහ

යම් ක්‍රියාවක් කර්මයක් බවට පත් වන්නේ චේතනාව මුල් කරගෙන තිදොරින් කරනු ලබන ක්‍රියා තුළිනි.

# සචේතනික ක්‍රියාවන් සිදු කෙරෙන ආකාරය අනුව කර්මය තුන් ආකාර වේ

1. කාය කම්ම ( කයින් සිදුවන සචේතනික ක්‍රියා)
2. වචී කම්ම (වචනයෙන් සිදුවන සචේතනික ක්‍රියා)
3. මනෝ කම්ම ( මනසින් සිදුවන සචේතනික ක්‍රියා)

# තිදොරින් කරන කර්මයේ ප්‍රධාන කොටස් දෙකකි

1. අකුසල කර්ම
2. කුසල කර්ම

# 01 අකුසල කර්ම





- සසර දුක් උපදවන, නරක අවැඩ දායක සචේතනික ක්‍රියා අකුසල කර්ම වේ.
- එම සචේතනික ක්‍රියා දස වැදෑරුම් වන අතර ඒවා දස අකුසල කර්ම නමින් හැඳින්වේ.

# දස අකුසල කර්ම ත්‍රිදොරට අනුව සිදු වන අයුරු

01. ප්‍රාණඝාතය
02. අදත්තාදානය
03. කාමමිත්‍යාචාරය

කාය කම්ම


08. අභිධ්‍යාව
09. ව්‍යාපාදය
10. මිත්‍යාදෘෂ්ටිය


මනෝ කම්ම

04. මුසාවාදය
05. පිසුනා වාචා
06. පරුසා වාචා
07. සම්ප්‍රපලාප

වචී කම්ම

# 01 කුසල කර්ම





- සසර සැප උපදවන වැඩදායක ක්‍රියා කුසල කර්ම වේ.
- ඉහත දැක් වූ ප්‍රාණඝාතය, අදත්තාදානය ආදී දස වැදෑරුම් අකුසල ක්‍රියාවන්ගෙන් වැළකී ප්‍රාණීන්ගේ ජීවිත ආරක්ෂා කිරිම, දඅන් දෙය පමණක් ගෙන අන් සතු දෙය ආරක්ෂා කිරිම ආදී දස කුසල ක්‍රියාවන්හි නිරත වීම.

# කර්ම රැස්කිරීම සඳහා පුද්ගලයා පොළඹවන ප්‍රධාන මානසික මූල (කුසල හා අකුසල මූල)

## 01. අකුසල මූල :-

i. ලෝභය
ii. ද්වේශය
iii. මෝහය

## 02. කුසල මූල :-

i. අලෝභය
ii. අද්වේශය
iii. අමෝහය

# කර්මයේ ප්‍රභේද

1. විපාක දෙන කාලය අනුව කර්මයෙහි කොටස් හතරකි
2. විපාක දෙන ආකාරය අනුව කර්මයෙහි කොටස් හතරකි
3. කෘත්‍ය හෙවත් කාර්යයන් අනුව කර්මයෙහි කොටස් හතරකි
4. වර්තමාන කර්ම සහ පාරිසරික සාධක මත අතීත කර්ම විපාක වෙනස් කරගත හැකි අවස්ථා

# කර්මයේ ප්‍රභේද

## 01. විපාක දෙන කාලය අනුව කර්මයෙහි කොටස් හතරකි

i. **දිට්ඨධම්මවේදනීය කර්ම** (මෙලොව දී ම විපාක දෙන කර්ම. ප්‍රවෘත්ති විපාක ඇත, ප්‍රතිසන්ධි විපාක නැත.)

ii. **උපපජ්ජවේදනීය කර්ම** (මරණින් මතු පළමු ආත්මභාවයේ දී විපාක දෙන කර්ම. ප්‍රවෘත්ති විපාක හා ප්‍රතිසන්ධි විපාක ඇත.පඤ්චානන්තරිය පාප කර්ම අකුසල පක්ෂයේ ද පඤ්ච අභිඥා, අෂ්ටසාමත්ති ධ්‍යාන උපදවා එයින් නොපිහිරී මියගිය අය සැප විපාක ද ලබයි)

iii. **අපරාපරියවේදනීය කර්ම** ( දෙවන ආත්මභාවයෙන් පසු කවර හෝ ආත්මභාවයක දී විපාක දෙන කර්ම. නිවන් දක්නා භවය දක්වා යම් භවයකි දී විපාක ලබා දෙයි.)

iv. **අභෝසි කර්ම** (විපාක නොදී අභෝසි වී යන කර්ම. යමෙකු සියලු කෙලෙසුන් නසා රහත් භාවයට පත්ව පිරිනිවන් පෑ විට කර්ම විපාක දීමට අවස්තාව නොලැබේ.)

# කර්මයේ ප්‍රභේද

## 02. විපාක දෙන ආකාය අනුව කර්මයෙහි කොටස් හතරකි

i. **ගරුක කර්ම** (වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් බලසම්පන්න කුසලාකුසල කර්ම)

ii. **ආසන්න කර්ම** (මරණාසන්න අවස්ථාවේ දී කරන ලද්දා වූ හෝ කලින් මොහොතක සිදු කරන ලදුව මරණාසන්න මොහොතේ සිතට නැගුණ කුසලාකුසල කර්ම)

iii. **ආචිණ්ණ කර්ම** (ජීවිත පුරුද්දක් ලෙස සිදු කරන ලද  කුසලාකුසල කර්ම හා කලින් කරන ලදුව නිරන්තරයෙන් සිහි කරන ලද කුසලාකුසල කර්ම)

iv. **කටත්තා කර්ම** (දැඩි චේතනාවක් නොමැති ව සිදු වන අසම්පූර්ණ කුසලාකුසල කර්ම)

# කර්මයේ ප්‍රභේද

## 03. කෘත්‍ය හෙවත් කාර්යයන් අනුව කර්මයෙහි කොටස් හතරකි

i. **ජනක කර්ම** (ප්‍රතිසන්ධිය ලබා දීමට ඉවහල් වන, එනම් මිය ගොස් ඊළඟ භවයක උපත ලබා දීමට ඉවහල් ව කර්ම)

ii. **උපස්ථම්භක කර්ම** (ජනක කර්මයට අනුබල දෙන එනම් කුසලාකුසල කර්මයන්ට උදව් දෙන කර්ම)

iii. **උප පීඩක කර්මය** (ජනක කර්මයට බාදා පමුණුවන, එහි බලය හීන කරවන කර්ම)

iv. **උප ඝාතක කර්මය** (ජනක කර්මයේ විපාක දීමේ හැකියාව නැති කොට තමා ම විපාක දෙන කර්ම)

# කර්මයේ ප්‍රභේද

- වර්තමාන කර්ම සහ පාරිසරික සාධක මත අතීත කර්ම විපාක වෙනස් කරගත හැකි හෝ නැති කරගත හැකි අවස්ථා

i. ගති සම්පත්ති
ii. උපධි සම්පත්ති
iii. කාල සම්පත්ති
iv. ප්‍රයෝග සම්පත්ති

i. ගති විපත්ති
ii. උපධි විපත්ති
iii. කාල විපත්ති
iv. ප්‍රයෝග විපත්ති

# කර්මයේ ප්‍රභේද

- ## ගති සම්පත්ති

යස ඉසුරින් පිරුණු පවුලක උපත ලැබූ විට පෙර භවයන්හී කරන ලද අකුසල කර්ම විපාක දීම වැළකී යයි.

- ## ගති විපත්ති

දිළිඳු පවුලක උපත ලැබූ විට පෙර භවයන්හී කරන ලද කුසල කර්ම විපාක දීම වැළකී යයි.

# කර්මයේ ප්‍රභේද

- ## උපධි සම්පත්ති

උපධිය යනු උසස් රූප ශෝභාව යි. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ රූප ශෝභාව නිසා වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලැබීම.

- ## උපධි විපත්ති

උපධිය යනු උසස් රූප ශෝභාව යි. පොහොසත් පවුලක උපත ලැබුව ද ඉහළ රූප ශෝභාව නිසා අවාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලැබීම.

# කර්මයේ ප්‍රභේද

## ➢ කාල සම්පත්ති

යහපත්, සෞභාග්‍යමත් කාලයක උපත ලැබූ විට පාප කර්ම විපාක නොලැබී යයි.යහපත් පාලකයෙකු ඇති කාලයක ඔහු ලබා දෙන ප්‍රතිලාභ අකුසල කර්ම සිදු කළ පුද්ගලයාට වුව ද ලැබේ.

## ➢ කාල විපත්ති

අයහපත්, දුෂ්කරතා වැඩි කාලයක උපත ලැබූ විට කුසල කර්ම විපාක නොලැබී යයි. අයහපත් පාලකයෙකු ඇති කාලයක ඔහුගෙන් වන පිඩාවන් කුසල කර්ම සිදු කළ පුද්ගලයාට වුව ද ලැබේ.

# කර්මයේ ප්‍රභේද

- **ප්‍රයෝග සම්පත්ති**

  ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන්, අධිෂ්ඨානයෙන් කටයුතු කිරීමෙන් තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක මගහරවා ගැනීමයි.

- **ප්‍රයෝග විපත්ති**

  ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන්, අධිෂ්ඨානයෙන් තොරව කටයුතු කිරීමෙන් තමාට විපාක දීමට ඇති කුසල කර්ම විපාක මගහරවා ගැනීමයි.

# තෙරුවන් සරණයි...